00097

**ශ්‍රී ලංකා විවෘත විශ්වවිද්‍යාලය**

**මානව ශාස්ත්‍ර සහ සමාජ විද්‍යා පීඨය**

**නීති අධ්‍යයන දෙපාර්තමේන්තුව**

**නීතිවේදී උපාධි පාඨමාලාව - 04 වන මට්ටම**

**අවසාන පරීක්ෂණය - 2022/2023**

**LLU 4805 / LWU2311- ගිවිසුම් නීතිය**

**කාලය - පැය තුන (03) යි.**

---

**දිනය : 2024 අප්‍රේල් 07** **වේලාව :- ප.ව. 1.30 - ප.ව. 04.30**

---

**1 කොටසින් ප්‍රශ්න එකක් (01) හා 2 කොටසින් ඕනෑම ප්‍රශ්න හතරක්ද (04) ඇතුළුව මුළු ප්‍රශ්න පහකට (05) පමණක් පිළිතුරු සපයන්න.**

**විභාග අපේක්ෂකයන්ගේ අපැහැදිලි අත්අකුරු සඳහා ලකුණු අඩුකරනු ලැබේ.**

**I කොටස**

**මෙම කොටසින් එක් (01) ප්‍රශ්ණයකට පමණක් පිළිතුරු සපයන්න.**

1. ප්‍රධානියෙකු විසින් ඔහු හෝ ඇය වෙනුවෙන් ක්‍රියා කිරීම පිණිස වෙනත් පුද්ගලයෙකු වෙත ප්‍රකාශිතවම අධිකාරියක් ලබා දී නොමැති අවස්ථාවලදී පවා නියෝජ්‍යත්ව ගිවිසුමක් ඇති විය හැකිය.
නියෝජ්‍යත්වය නිර්මාණය සම්බන්ධ නීතිය ඇසුරින් ඔබේ පිළිතුර තහවුරු කරමින් එවැනි ගිවිසුම් පැණ නැඟිය හැකි ආකාරය පැහැදිලි කරන්න .

(ලකුණු 20)

2. ඇනා වෙනත් රටවල පාරිභෝගිකයන්ට ශීතකළ බෙරි නැව්ගත කිරීම සඳහා ඇගේ නියෝජිතයා ලෙස බිල් පත් කළාය. ඇය ඔහුගේ සේවය වෙනුවෙන් ඔහුට මාසික වැටුපක් ගෙවන ලදී. මෙම නියෝජ්‍යත්ව ගිවිසුමට සම්බන්ධ පහත සිද්ධීන්හි නෛතික ප්‍රතිවිපාකයන් සාකච්ඡා කරන්න.

(අ). බිල්, බෙරි ඇණවුමක් සඳහා කැතීගෙන් මුදල් ලබාගත් නමුත් ඇයට භාණ්ඩ නැව්ගත නොකළේය. එමෙන්ම ඔහු ඇනා වෙත එම මුදල් ලබා නොදුන්නේය. කැතී, ඇනාගෙන් මුදල් ආපසු ඉල්ලා සිටී.

(ලකුණු 6)

(ආ). බිල් ශීතකරණ පහසුකම් නොමැති නැවකින් ටොම් වෙත බෙරි පෙට්ටියක් නැව්ගත කළ අතර එය ටොම් වෙත ළඟා වන විට බෙරි නරක් වීමට ලක්ව තිබිණි.

(ලකුණු 6)

(ඇ). බිල්ට ඔහුගේ සේවාවන් සඳහා වැටුපක් ගෙවනු නොලැබුවේනම් ඉහත (අ) අවස්ථාව සහ (ආ) අවස්ථාව සඳහා ඔබ විසින් ලබා දුන් පිළිතුර වෙනස් වන්නේද? ඔබේ පිළිතුර සඳහා හේතු පැහැදිලි කරන්න.

(ලකුණු 8)

## 2 කොටස

**මෙම කොටසින් ඕනෑම ප්‍රශ්ණ හතරකට (04) පිළිතුරු සපයන්න.**

3. පහත සඳහන් ඕනෑම **දෙකක් (02)** සම්බන්ධව කෙටි සටහන් ලියන්න.
   (අ). බාලවයස්කරුවන් විසින් එළඹෙනු ලබන ගිවිසුම් (ලකුණු 10)
   (ආ). ඉන්පාරිඩිලික්ටෝ (*in pari delicto potier est conditio defendentis*) ආප්තයට අදාළ ව්‍යතිරේඛයන් (ලකුණු 10)
   (ඇ). *Non est factum* යන ආයාචනය (ලකුණු 10)

4. පහත ඒවා අතර ඇති **වෙනස්කම්** පැහැදිලි කරන්න.
   (අ). හරස් අර්පණය සහ ප්‍රතිඅර්පණය (ලකුණු 4)
   (ආ). සෑහෙන දුරට ඉටු කිරීම සහ කටයුතු ඉටු කිරීමට ඉදිරිපත් වීම. (ලකුණු 4)
   (ඇ). *Donatio mortis causa* සහ *donation inter vivos* (ලකුණු 4)
   (ඈ). අහිංසක අවනිදේශනය සඳහා වන ප්‍රතිකර්ම සහ වංචනික අවනිදේශනය සඳහා වන ප්‍රතිකර්ම (ලකුණු 4)
   (ඉ). සාධාරණ හේතුව සහ ප්‍රතිෂ්ඨාව (ලකුණු 4)

   (4 x 5 = ලකුණු 20)

5. පහත දී ඇති ගණුදෙනුවල නෛතික ප්‍රතිවිපාකයන් සාකච්ඡා කරන්න. ඔබේ පිළිතුර නඩු තීරණ මඟින් තහවුරු කරන්න.

   (අ). ඒබීසී සහ සමාගම (ABC & Co.) කොළඹ පිහිටි මෘදුකාංග නිෂ්පාදනය කිරීමේ සමාගමකි. දමින්ද්‍රි සමාගම වෙනුවෙන් මෘදුකාංග වැඩිදියුණු කිරීම සඳහා සම්බන්ධව කටයුතු කරන මෘදුකාංග ඉංජිනේරුවරියකි. ඒබීසී සහ සමාගම (ABC & Co.) දමින්ද්‍රිගේ සේවා ගිවිසුමට වගන්තියක් ඇතුළත් කරමින්, ඇය සමාගමෙන් ඉවත් වීමෙන් පසු වසර තුනක් යන තෙක් ලෝකයේ කවර හෝ ස්ථානයක ඒ හා සමාන සංවිධානයකට සම්බන්ධ වීම වළක්වා ඇත.

   (ලකුණු 8)

(ආ). "විටමින් ෆෝ හෙල්ත්" ශ්‍රී ලංකාවට විටමින් ආනයනය කරනු ලබන සමාගමකි. සමාගම ආනයනය පිරිවැයෙන් 10% ක් තම පුද්ගලික ගිණුමට බැර කිරීමට එකඟ වූ බැවින් සෞඛ්‍ය අමාත්‍යවරයා විසින් මිනිස් පරිභෝජනයට සුරක්ෂිතද යන්න තවමත් පරීක්ෂා කරමින් පවතින විටමින් වර්ගයක් ආනයනයට එම සමාගමට අවසර ලබා දෙන ලදී. (ලකුණු 6)

(ඇ). ගණිකා නිවාසයක හිමිකාරිය වන ඩොරති, එම ගණිකා නිවාසයේ ගණිකාවක ලෙස සේවය කරන ස්වීටිගේ සේවය සඳහා පොරොන්දු වූ මුදල ගෙවීම ප්‍රතික්ෂේප කරන ලදී. (ලකුණු 6)

6. (අ). ගිවිසුමක් කඩකිරීමකදී, අහිංසක පාර්ශවය ගිවිසුම අවසන් කරවා ගැනීමට හිමිකම් ලබන අවස්ථාවන් පැහැදිලි කරන්න.

(ලකුණු 6)

(ආ) සොෆී විසින් හෝටලක් ඉදිකිරීමේ ව්‍යාපෘතියක් භාරගෙන ඇත. එම ව්‍යාපෘතියට අදාළව ඇය විසින් එළැඹී ඇති ගිවිසුම්වලට අදාළ පහත සිදුවීම් වල නෛතික බලපෑම පැහැදිලි කරන්න.

(i). ප්‍රධාන සැපයුම්කරුවෙකු වන මොහිදීන්, රතු මුහුදේ අර්බුදය නිසා මුහුදු ගමන් දිගු වීමෙන් නැව් ගාස්තු වැඩි කිරීම නිසා, භාණ්ඩ නැව්ගත කිරීම ප්‍රතික්ෂේප කරයි.

(ලකුණු 6)

(ii). සොෆී දැනටමත් මුදල් ගෙවා ඇති නමුත් ශ්‍රී ලංකාව, රුසියා - යුක්‍රේන් යුද්ධය හේතුවෙන් රුසියාව සමඟ ව්‍යාපාර සිදු කිරීම තහනම් කර ඇති බැවින් රුසියාවෙන් හෝටල් සඳහා බුමුතුරුණු සපයනු ලබන ෂීබා හට භාණ්ඩ බෙදා හැරීමට නොහැකිව ඇත. (ලකුණු 6)

(iii). හෝටල් කාමර සැරසීම සඳහා ගිවිසුම්ගත වූ ප්‍රසිද්ධ අභ්‍යන්තර අලංකරණ ශිල්පිනියක වන කමලා, ගිවිසුම අනුව ඇය වැඩ ආරම්භ කිරීමට පෙර කාර් අනතුරකින් මිය ගියාය.

(ලකුණු 2)

7. නාවල විශ්වවිද්‍යාලය, විශ්වවිද්‍යාලයේ පිහිටි පැරණි තෙමහල් ගොඩනැගිල්ල අලුත්වැඩියා කිරීමට තීරණය කළේය. ඉඩකඩ සීමිත වීම මත අලුත්වැඩියාව සිදු වන අතරතුරදී ගොඩනැගිල්ලේ ඉහළ මහළයන්හි සේවකයන් අඛණ්ඩව වැඩ කරමින් සිටියහ. එහි ප්‍රතිඵලයක් ලෙස ගොඩනැගිල්ල තුළදී තුවාල ලැබීම් කිහිපයක් සිදු විය. සිසුවියක වූ අමන්දා, ගොඩනැගිල්ල තුළදී ඇගේ පරීක්ෂකවරයා හමුවීමට වේලාවක් වෙන් කර ගෙන සිටි අතර, ගොඩනැගිල්ලට ප්‍රවේශ වන ස්ථානයේ තිබූ බුරුල් වූ ගඩොල් කැටයක් මත වැටීමෙන් ඇගේ කකුල කැඩී ගියේය. කථිකාචාර්යවරයෙකු වූ සමන් මතට බාල්කයක් වැටුණු අතර, ඔහු

බරපතළ හිසේ තුවාලයන්ට ලක් විය. ඔහුගේ ලැප්ටොප් පරිගණකයට ද බරපතළ ලෙස හානි විය. ඉදිකිරීම් අතරතුර මතු වූ දූවිලි තත්ත්වය හේතුවෙන් සේවකයන් කිහිපදෙනෙකුට පපුවේ ආසාදන හේතුවෙන් රෝහල් ගත වීමට සිදු විය.සේවකයන් විශ්වවිද්‍යාල බලධාරීන්ට පැමිණිලි කළ අතර, ඔවුන් තර්ක කරනුයේ, ගොඩනැගිල්ලට ඇතුළු වන ස්ථානයේ තබා ඇති දැන්වීමෙන් පහත පරිදි ප්‍රකාශ කරන බැවින් ඔවුන් වගකීමට ලක් නොවන බවයි. ' මෙය ඉදිකිරීම් සිදුවන ස්ථානයකි. ඔබ මෙම ගොඩනැගිල්ලට ඇතුළු වන විට ප්‍රවේශම් වන්න. මෙම ගොඩනැගිල්ල තුළ සිටියදී කිසිවෙකුට සිදු වන තුවාලයක් හෝ පාඩුවක් සඳහා විශ්වවිද්‍යාලය වගකියනු නොලැබේ'.

ඔබ විශ්වවිද්‍යාල බලධාරීන්ගේ ස්ථාවරය සමඟ එකඟ වන්නේද? උචිත නඩු තීරණ සහ ව්‍යවස්ථාපිත ප්‍රතිපාදන ඇසුරින් ඔබේ පිළිතුර පැහැදිලි කරන්න.

(ලකුණු 20)

8. මෑත වර්ෂවලදී, ගිවිසුම් නීතියේ වැදගත් වෙනස්කම් සිදුව ඇත. මෙයට ගිවිසුම් ඇති වන්නේ කෙසේද, ඒවා මගින් ආවරණය කරනු ලබන විෂය කරුණු මොනවාද සහ ගිවිසුමක් කඩ වූ විට පවතින ප්‍රතිකර්ම ඒ්ට ඇතුළත් වේ.

එවැනි තත්ත්වයන් සමඟ කටයුතු කිරීම සඳහා ගිවිසුම් නීතියේ මූලධර්ම පුළුල් විය යුතු ක්ෂේත්‍ර අවම වශයෙන් **හතරක් (04)** හඳුනාගෙන මෙම අභියෝග වලට මුහුණ දීම සඳහා පවත්නා නීතිය කොතරම් දුරට සාර්ථකව නව්‍යකරණයට ලක්ව ඇද්ද යන්න සාකච්ඡා කරන්න. ඔබේ පිළිතුර පැහැදිලි කිරීම පිණිස ව්‍යවස්ථාපිත ප්‍රතිපාදන සහ නඩු තීරණ (ඇත්නම්) මෙන්ම ප්‍රායෝගික නිදර්ශනයන්ද භාවිතා කරන්න. (ලකුණු 20)

****හිමිකම් ඇවිරිණි****